# විෂ සහිත සන්ධිපාදකයෝ



පාරිසරික සමතුලිතතාවය සහ ජෛව විවිධත්වය සුරක්ෂිත කිරීමෙහි ලා වැදගත් මෙහෙවරක් ඉටු කරන විෂ සහිත සන්ධිපාදකයන් ආරක්ෂා කර ගැනීම අප කාගේත් යුතුකමකි."

ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා ජාතික රෝහල
කොළඹ

# බඹරු, දෙබරු සහ මී මැසි විෂ

- බඹරුන්, දෙබරුන් වැනි කෘමී සතුන්ගෙන් මිනිසාට අනතුරු සිදු වීම වර්තමානයේ දැකිය හැකි බහුල සිදු වීමකි.

- මෙම කෘමීන් දෂ්ටනය සඳහා උදරයේ කෙළවරේ පිහිටි විත උපයෝගී කර ගනී.
එය විෂ නිෂ්පාදනය කරනු ලබන ග්‍රන්ථි හා සම්බන්ධව ඇත.

- කුඩා දරුවන්, වයෝවෘද්ධ පුද්ගලයන්, ඇදුම රෝගීන්, හෘද රෝග හා අසාත්මිකතා ඇති පුද්ගලයන්ට මෙවන් කෘමී දෂ්ටන නිසා වැඩි හානියක් සිදුවිය හැකිය.

- මෙම කෘමීන්ගේ සමූහ දෂ්ටනයකට භාජනය වීම මරණය පවා ගෙන දීමට හැකිය. මෙකී කෘමි දෂ්ටනයකට ලක් වූ පුද්ගලයකු විවිධ අසාත්මික රෝග ලක්ෂණ පෙන්වීම ප්‍රධාන වශයෙන් දැකිය හැකිය.



මී මැස්සා ***Apis cerana***

**දෙබරා *Vespa affinis affinis***






**බඹරා (giant honey bee)**

# රෝග ලක්ෂණ

1. දෂ්ට කළ ස්ථානය කැසීම, ඉදිමීම
2. රතු ලප ඇති වීම
3. වමනය
4. උදරයේ වේදනාව
5. ක්ලාන්තය

❖ මෙම ලක්ෂණවලට අමතරව Analphylaxis නැමැති භයානක තත්ත්වයක් ඇති විය හැක. මෙහිදී හුස්ම ගැනීමේ අපහසුතා, රුධිර පීඩනය අඩු වීම වැනි සංකූලතා ඇති විය හැකිය.

# ප්‍රථමාධාර

- දෂ්ට කළ ස්ථානය හොඳින් සබන් ගා සෝදන්න.
- වේදනාව සමනය කර ගැනීමට දෂ්ට කළ ස්ථානය මත අයිස් තබන්න.
- වේදනානාශක ඔසුවක් (Paracetamol) භාවිතා කරන්න.
- ක්ලාන්තය හා හුස්ම ගැනීමේ අපහසුතා වැනි රෝග ලක්ෂණ ඇත්නම් හැකි ඉක්මණින් රෝහල කරා රැගෙන යන්න.







- රෝගියාගේ බිය දුරු කරන්න

- විත ඇත්නම් එය ඉවත් කිරීම - ට්විසරයක් (Focep) හෝ ඝණ කාඩ්බෝඩ් කැබැල්ලක් භාවිතයෙන් , තෙරපීමකින් තොරව ඉවත් කරන්න.







# බඹරු/ දෙඹරු දෂ්ටන අවම කරලීමට ගත හැකි ක්‍රියා මාර්ග

මොවුන් බහුලව ගැවැසෙන ප්‍රදේශවල

- එළිමහනේ, පැණි බීම, පැණි රසැති ආහාර වර්ග රැගෙන යාමෙන් සහ අනුභව කිරීමෙන් වලකින්න
- පරිසරයේ එකතු වී ඇති පළතුරු හා අනෙකුත් අපද්‍රව්‍ය ඉක්මණින් ඉවත් කරන්න.
- මොවුන් ගැවසෙන ප්‍රදේශවල සංචාරය කිරීමේදී ශරීරය සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි ඇදුම් අඳින්න.(තද වර්ණයෙන් යුත් ඇදුම් ඇදීමෙන් වළකින්න) හිස් වැසුම් හා පාවහන් පළඳින්න.
- සුවඳ විලවුන් වැනි දෑ ගැල්වීමෙන් වළකින්න.
- මොවුන්ගේ වාසස්ථානවලට ගල් ගැසීමෙන් හා හිරිහැර කිරීමෙන් වළකින්න.



# ගෝනුසු විෂ

- දිවා කාලයේ ගල් තුළ හෝ හුඹස් තුළ හෝ ගසක පොතු අතර ජීවත් වේ.

- ලංකාවේ බහුලව දැකිය හැක්කේ කළු ගෝනුසු විශේෂය වන අතර ඔවුන් දෂ්ටනයේදී දෂ්ට කල ස්ථානයේ වේදනාව, ඉදිමුම, කැසීම වැනි සුළු අසාත්මිකතා තත්ත්ව ඇති විය හැකිය.



***Heterometrus spp.***

# රතු ගෝනුස්සා - *Hottentotta tumulus*

- රතු ගෝනුසු විශේෂය ශ්‍රී ලංකාවට ආවේණික නොවන අතර යාපනය අර්ධද්වීපයෙන් හමු වී ඇත.

- මේ ගෝනුසු දශ්ටන පලාලි, අච්චුවේලි සහ කරෙයිනගර් යන ප්‍රදේශවලින් වාර්තා වූ අතර, මරණද වාර්තා වී ඇත.




Red Scorpion
The Red Scorpion has 31 pectinal teeth while those in Sri Lanka have less than 25.
Collection sites of the Red Scorpions within the Jaffna peninsula
Palali
Karainagar
Achchuveli
Jaffna
Scorpions found earlier in Sri Lanka
1 Buthoscorpio sarasinorum
2 Charmus laneus
3 Charmus minor
4 Isometrus basilicus
5 Isometrus besuchebi
6 Isometrus garyi
7 Isometrus loebli
8 Isometrus thurstoni
9 Isometrus thwaitesi
10 Lychas ceylonensis
11 Lychas srilankensis
12 Chaerilus ceylonensis
13 Heterometrus indus
14 Heterometrus swammerdami Simon
15 Heterometrus gravimanus
ST Graphic by Indramuthi Jayasuriya

# රතු ගෝනුස්සන් දෂ්ටනයේ රෝග ලක්ෂණ

- හෘද ස්පන්දනය වැඩි වීම
- ක්ලාන්තය
- අධික දහඩිය දැමීම
- අධිකව බේටය ශ්‍රාවය වීම
- සිරුරේ රෝම කෙළින් වීම
- කම්පනය ඇති වීම
- හෘදය අකර්මණ්‍ය වීම

**දෂ්ටන නිසා රුධිර පීඩන වෙනස් වීම් ඇති විය හැකිය.**

**ඉහත රෝග ලක්ෂණ ඇත්නම් හැකි ඉක්මණින් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න.**

# දෂ්ටන වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග

- ගෝනුස්සාට පහසුවෙන් සැඟ විය හැකි සපත්තු, මේස්, බූට්ස් ආදිය නිවසින් පිටත නොතබන්න.
- තුවා, රෙදි, මේස්, සපත්තු ආදිය පැළදීමට පෙර සැළකිලිමත් වන්න.
- ගෙවත්තේ වැඩ කරන අවස්ථාවලදී අත් වැසුම් පළදින්න.
- නිවසින් පිටත යන විට විශේෂයෙන් රාත්‍රී කාලයේදී පාවහන් පළදින්න. විදුලි පන්දමක්ද රැගෙන යන්න.

**Tel:** 011-2686143 / 011-2691111 Ext. 2430

**Email :** npdic.nhs@gmail.com

infotoxlanka@gmail.com

https://www.facebook.com/ NTPICSL

https:// twitter .com / PoisonCenterSL

**Web site** http://www.toxbaselanka.info